# වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය
# ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය
# පුරප්පාඩු

ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## *1. නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (තාක්ෂණ) - පුරප්පාඩු 01*

- **සුදුසුකම් :**

➢ **බාහිර :**

**වෘත්තීය සුදුසුකම්**

පළමුවැනි හෝ දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් සහිත සිව් අවුරුදු (04) විද්‍යා හෝ කෘෂිකර්ම උපාධිය සහ අදාල ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධිය (Ph.D)

**පළපුරුද්ද** :

අ) පිළිගත් ආයතනයක අවම වශයෙන් වසර දහසයක (16) කළමනාකරණ මට්ටමේ පර්යේෂණ පළපුරුද්ද හා කළමනාකරණ පළපුරුද්ද. එයින් වසර අටක් (08) ආචාර්ය උපාධිය (Ph.D) ලබාගැනීමෙන් පසුව විය යුතු අතර, අවම වශයෙන් වසර දෙකක් (02) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක විය යුතුය.

**සහ**

ආ) විවිධ ක්ෂේත්‍රවල පර්යේෂණ විද්‍යාඥයින් සඳහා නායකත්වය ලබාදීමේ සහ මෙහෙයවීමේ හැකියාව පෙන්නුම් කළ යුතුය. මානව සහ සෙසු සම්පත් කාර්යක්ෂමව කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද අමතර සුදුසුකමක් සේ සළකනු ලැබේ.

➢ **අභ්‍යන්තර :**

**වෘත්තීය සුදුසුකම්**

අදාල ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධිය (PhD)

**පළපුරුද්ද** :

අ) රබර් පර්යේෂණ ආයතනයේ දෙපාර්තමේන්තු ප්‍රධානි/ප්‍රධාන පර්යේෂණ නිලධාරි/ප්‍රධාන උපදේශක නිලධාරි ලෙස අවම වශයෙන් වසර හතරක (04) සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම

**සහ**

ආ) විවිධ ක්ෂේත්‍රයන්හි පර්යේෂණ විද්‍යාඥයින් සඳහා නායකත්වය ලබාදීමේ සහ මෙහෙයවීමේ හැකියාව පෙන්නුම් කළ යුතුය. මානව සහ සෙසු සම්පත් කාර්යක්ෂමව කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද අමතර සුදුසුකමක් සේ සළකනු ලැබේ.

- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.

- **සේවා කාණ්ඩය** : ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සේවය (HM 1-3)

- **වැටුප් පරිමාණ** : රු.152,500 – 15 x 4,100 – රු.214,000

- **අනෙකුත් ප්‍රතිලාභ :**

  මූලික වැටුපට අමතරව පහත සඳහන් දීමනා ද ගෙවනු ලැබේ.

  i. ජීවන වියදම් දීමනාව
  ii. ප්‍රවාහන දීමනාව හෝ වෙන් කරන ලද නිල රථය
  iii. ඉන්ධන දීමනාව
  iv. වෘත්තීය දීමනාව
  v. සන්නිවේදන දීමනාව

- **රැකියා විස්තරය :** රබර් වගාව, රබර් සැකසීම සහ තාක්ෂණික දැනුම සම්ප්‍රේශනය කිරීම සම්බන්ධයෙන් පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- **තේරීමේ ක්‍රමය :** පත්වීම් බලධාරියා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

## *2. රබර් ව්‍යාප්ති නිලධාරි - පුරප්පාඩු 05*

- ***සුදුසුකම්***

➢ <u>බාහිර</u> **: (පහත 1 හෝ 2 හෝ 3 හෝ 4)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් විද්‍යාව/කෘෂිකර්මය/වැවිලි කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබිම.

2. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද, අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් NVQ 7 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

3. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද, අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් NVQ 6 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

   <u>**සහ**</u>

   සුදුසුකම් ලැබීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ රජයේ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්දක් තිබීම.

4. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද, අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් NVQ 5 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

   <u>**සහ**</u>

   සුදුසුකම් ලැබීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ රජයේ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර දහයක (10) පළපුරුද්දක් තිබීම

➢ **අභ්‍යන්තර : (පහත 1 හෝ 2 )**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම

2. කළමනාකරණ සහකාර තාක්ෂණික කාණ්ඩයේ (MA 2-2) කාර්මික නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන) තනතුරක අවම වශයෙන් වසර අටක (08) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

- **වයස :** අවුරුදු 22 ට වඩා අඩු නොවිය යුතු අතර අවුරුදු 45 ට වඩා වැඩි නොවිය යුතුය. මෙම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අදාල නොවේ.

- **සේවා කාණ්ඩය :** ක්‍රියාත්මක කිරීමේ/උපදේශක (MA – 4)

- **වැටුප් පරිමාණ :** රු. 64,320 - 10 x 1,360 – 15 x 1,670 – 5 x 2,040 - 113,170

- **අනෙකුත් ප්‍රතිලාභ** : ඉහත දක්වා ඇති වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

- **රැකියා විස්තරය** : ප්‍රධාන උපදේශක නිලධාරි / ජ්‍යෙෂ්ඨ උපදේශක නිලධාරි / උපදේශක නිලධාරිගේ අධීක්ෂණය යටතේ රබර් ව්‍යාප්ති කටයුතු සහ ක්‍රියාකාරී පර්යේෂණ කටයුතු සිදු කිරීම, රබර් ක්ෂේත්‍රයට අදාළ සියලුම ව්‍යාප්ති හෝ උපදේශන කටයුතුවල නියැලීම සහ අදාළ කෘෂිකාර්මික හා කෘෂිකාර්මික නොවන සේවාවන් සම්බන්ධීකරණය සිදුකිරීම. ආයතනය විසින් සංවර්ධනය කරන ලද තාක්ෂණයන් මෙම ක්ෂේත්‍රයට සම්බන්ධ සියලුම කොටස් කරුවන් වෙත, විශේෂයෙන්ම කුඩා වතු හිමියන් වෙත සම්ප්‍රේෂණය කිරීම මගින් වගා ප්‍රමිතීන් ඉහළ නැංවීම, යහපත් කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කරවීම සහ එම අංශයේ සේවකයින්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීම සඳහා වගකිව යුතු වේ.

- **තේරීමේ ක්‍රමය පරීක්ෂණය** : ලිඛිත තරඟ විභාගයක ප්‍රතිඵල මත (භාෂා නිපුනත්වය/අභියෝගතා හා තනතුරට අදාල විෂය දැනුම) සහ/හෝ පත්වීම් බලධාරියා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

## *3. කාර්මික නිලධාරි (පර්යේෂණ හා සංවර්ධන) - පුරප්පාඩු 15*

- ***සුදුසුකම්***

➢ **බාහිර** : තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික හෝ වෘත්තීය පුහුණු ආයතනයක් මගින් නිකුත් කරන ලද, අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

➢ **අභ්‍යන්තර**

ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම

- **වයස** : අවුරුදු 18 ට වඩා අඩු නොවිය යුතු අතර අවුරුදු 45 ට වඩා වැඩි නොවිය යුතුය. මෙම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අදාල නොවේ.

- **සේවා කාණ්ඩය** : කළමනාකරණ සහකාර (තාක්ෂණ) (MA 2-2 )

- **වැටුප් පරිමාණ** : රු. 50,540 - 10 x 540 -7 x 630 – 4 x 1,080 -20 x 1,280 - 90,270

- **අනෙකුත් ප්‍රතිලාභ** : ඉහත දක්වා ඇති වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

- **රැකියා විස්තරය** : පර්යේෂණ නිලධාරීන් (ප්‍රධාන පර්යේෂණ නිලධාරි/ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි/ පර්යේෂණ නිලධාරි) සහ අත්හදාබැලීමේ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ පර්යේෂණ ව්‍යාපෘති පවත්වාගෙන යාමට සහාය වීම සහ සාම්පල පරීක්ෂා කිරීමට සහාය වීම මොවුන්ගේ වගකීමකි. තවද, සියලුම ආකාරයේ රසායනාගාර කටයුතු නඩත්තු කිරීම, පුහුණු වැඩසටහන් පැවැත්වීමට සහාය වීම, උපදේශන චාරිකා, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු, රසායනාගාර වාර්තා සකස් කිරීම සහ පර්යේෂණ නිලධාරීන්ට ඔවුන්ගේ රාජකාරි ඉටු කිරීමේදී සහාය වීමද මොවුන්ගේ වගකීම වේ.

- **තේරීමේ ක්‍රමය :** ලිඛිත තරඟ විභාගයේ ප්‍රතිඵල මත (භාෂා නිපුනත්වය/අභියෝගතා පරීක්ෂණය හා තනතුරට අදාල විෂය දැනුම) සහ/හෝ පත්වීම් බලධාරියා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**පොදු කොන්දේසි**

1. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි.
2. අයදුම්කරු මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් පසුවිය යුතුයි
3. අයදුම්කරු දිවයින තුළ ඕනෑම ස්ථානයක සේවය කිරීමට කැමති විය යුතුයි.

**පොදු ප්‍රතිලාභ**

1. 1983 අංක 12 දරණ පාරිතෝෂික දීමනා පනත යටතේ හා 2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2025 අනුව පාරිතෝෂික ගෙවනු ලැබේ.
2. දායකත්ව වෛද්‍යාධාර යෝජනා ක්‍රමයට හිමිකම් ඇත.
3. අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදල (අපේක්ෂකයන් විසින් වැටුපෙන් 10% ක් හා මණ්ඩලය විසින් 15% ක් අර්ථසාධක අරමුදල සඳහා සහ 3% ක් සේවා නියුක්තියන්ගේ භාර අරමුදල සඳහා ද දායක වනු ඇත.)
4. රබර් පර්යේෂණායතනයේ සේවකයින් හට ලැබෙන අනෙකුත් ප්‍රතිලාභ ද හිමිවනු ඇත.

**අයදුම්පත් ක්‍රියාවලිය**

අයදුම්කරුවන් විසින් උප්පැන්න සහතිකය සහ අනෙකුත් අදාළ සියළුම අධ්‍යාපන හා වෙනත් සහතිකපත්වල පිටපත් සහ චරිත සහතික දෙකක් (ඉන් එකක් ග්‍රාම නිලධාරිගෙන් විය යුතුය), ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංක ද සමඟ අයදුම්කරුවන් විසින් අත්සන් කරන ලද තම අයදුම්පත 2026.07.20 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ සභාපති, රබර් පර්යේෂණ මණ්ඩලය, තෙලවල පාර, රත්මලාන යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

ප්‍රමාදවී එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රජයේ දෙපාර්තමේන්තු/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන නිලධාරීන් තම අයදුම්පත් ඔවුන්ගේ ආයතන ප්‍රධානින් මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පතේ පිටපතක් සෘජුවම එවිය හැකි ය.

ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතු ය.

අදාල සහතිකවල සහතික කරනලද පිටපත් නොමැතිව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බව කාරුණිකව සලකන්න.

මේ පිළිබඳව බලපෑම් කිරිම නුසුදුසුකමක් වනු ඇත.

සභාපති
රබර් පර්යේෂණ මණ්ඩලය
තෙලවල පාර
රත්මලාන.
2026.06.24